# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 1993 අංක 60 දරන
## ශ්‍රී ලංකා දුම්රිය අධිකාරිය පනත

---

[සහතිකය සටහන් කළේ 1993 දෙසැම්බර් මස 15 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1993 දෙසැම්බර් මස 17 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 7, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකිය.

මිල : රු. 2.10 යි. තැපැල් ගාස්තුව : රු. 1.55 යි.

# 1993 අංක 60 දරන ශ්‍රී ලංකා දුම්රිය අධිකාරිය පනත

[සහතිකය සටහන් කළේ 1993 දෙසැම්බර් මස 15 වන දින]

එල්. ඩී.—ඕ. 54/91

දුම්රියෙන් මගීන් සහ භාණ්ඩ ප්‍රවාහනය කිරීමේ ව්‍යාපාරය කර ගෙන යාම පිණිස ශ්‍රී ලංකා දුම්රිය අධිකාරිය පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද දුම්රිය දෙපාර්තමේන්තුවේ සියලු දේපළ, අයිතිවාසිකම් හා බැරකම් ශ්‍රී ලංකා දුම්රිය අධිකාරිය වෙත පැවරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද 1979 අංක 7 දරන රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබා ගැනීමේ) පනත සහ (200 වන අධිකාරය වූ) දුම්රිය ආඥාපනත සංශෝධනය කිරීම පිණිස සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1993 අංක 60 දරන ශ්‍රී ලංකා දුම්රිය අධිකාරිය පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයක එය ක්‍රියාත්මක විය යුතු ය. මේ පනතේ වෙනස් වෙනස් විධිවිධාන සම්බන්ධයෙන්, වෙනස් වෙනස් දිනයන් නියම කරනු ලැබිය හැකි අතර, ඒ අනුව "නියමිත දිනය" සම්බන්ධව මේ පනතේ යම් විධිවිධානයක කර ඇති යම් සඳහන් කිරීමක්, ඒ විධිවිධානය ක්‍රියාත්මක කිරීම සඳහා මේ වගන්තිය යටතේ නියම කරන ලද දිනය සම්බන්ධයෙන් කරන ලද සඳහන් කිරීමක් ලෙස තේරුම් ගනු ලැබිය යුතු ය. සංක්ෂිප්ත නාමය සහ ක්‍රියාත්මක වන දිනය.

## I වන කොටස

### ශ්‍රී ලංකා දුම්රිය අධිකාරිය පිහිටුවීම, එහි බලතල හා කර්තව්‍ය

2. (1) (මෙහි මින් මතු "දුම්රිය අධිකාරිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා දුම්රිය අධිකාරිය යන නමින් හඳුන්වනු ලබන අධිකාරියක් පිහිටුවනු ලැබිය යුතු ය. ශ්‍රී ලංකා දුම්රිය අධිකාරිය.

(2) දුම්රිය අධිකාරිය, (1) වන උපවගන්තියෙන් ඊට පැවරී ඇති නාමයෙන් අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු අතර, සංස්ථාව විසින් එහි සංස්ථා නාමයෙන්, නඩු පැවරීම ද එයට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කළ හැකි ය.

3. (1) දුම්රිය අධිකාරියේ කටයුතු පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) අධ්‍යක්ෂ මණ්ඩලයක් වෙත පැවරිය යුතු අතර, ඒ මණ්ඩලය— දුම්රිය අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය.

(අ) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන, ප්‍රවාහනයට හෝ ඊට සම්බන්ධිත ක්ෂේත්‍රවලට අදාළ මහා පරිමාණයේ වාණිජ ව්‍යවසායන් කළමනාකරණය පිළිබඳ පෘථුල පළපුරුද්දක් ඇති තැනැත්තකු විය යුතු සභාපතිවරයකුගෙන් ;

2—ඩී 027833—6,780 (93/06)

(අ) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන, අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නියෝජිතයකුගෙන් ;

(ආ) මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන, මහා භාණ්ඩාගාරයේ නියෝජිතයකුගෙන් ;

(ඇ) කළමනාකරණ අධ්‍යක්ෂවරයාගෙන් ;

(ඉ) ප්‍රවාහනය, මුදල්, අලෙවිකරණය, නීතිය හෝ ඉංජිනේරු ශිල්පය පිළිබඳ ක්ෂෙත්‍රයන්හි පළපුරුද්ද ඇත්තා වූ ද, ඒ පිළිබඳ ශක්තතාව පෙන්නුම්කර ඇත්තා වූ ද, තැනැත්තන් අතුරින් අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන වෙනත් සාමාජිකයන් තුන් දෙනකුගෙන්

සමන්විත විය යුතු ය.

(2) මේ පනතේ පළමුවන උපලේඛනයේ විධිවිධාන, සභාපතිවරයාගේ සහ මණ්ඩලයේ සාමාජිකයන්ගේ පත්වීම හා ධුර කාලය සම්බන්ධයෙන් සහ මණ්ඩලයේ රැස්වීම් සම්බන්ධයෙන් බල පැවැත්විය යුතු ය.

දුම්රිය අධිකාරියේ මූලික කර්තව්‍ය.

4. ශ්‍රී ලංකාව ඇතුළත කාර්යක්ෂමව, තරඟකාරීව සහ ලාභ සහිතව භාණ්ඩ සහ තැනැත්තන් ප්‍රවාහනය කිරීම සඳහා දුම්රිය සේවා සැලැස්වීම සහ ඒ සේවා ක්‍රියාත්මක කිරීම, දුම්රිය අධිකාරියේ මූලික කර්තව්‍ය විය යුතු ය.

දුම්රිය අධිකාරියේ වෙනත් කර්තව්‍ය.

5. 4 වන වගන්තියේ ව්‍යාප්තියට හානියක් නොමැතිව—

(අ) දුම්රියෙන් භාණ්ඩ හා තැනැත්තන් ගෙන යාම සඳහා සේවා සැලැස්වීමෙහි දී, දුම්රිය අධිකාරිය විසින් කරනු ලබන ආයෝජන ණය නිලව් වීම සහතික කරන සහ ඒ සේවා සැලැස්වීමෙහි දී දුම්රිය අධිකාරිය විසින් ආයෝජනය කරනු ලබන ප්‍රාග්ධනය මත නිසි ඵලප්‍රයෝජනයක් ලැබීම සහතික කරන ගාස්තු අනුව ඒ සේවා සැපයීම ;

(ආ) විධිමත් ගාස්තු අය කිරීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමෙන් ජාතියට උපරිම ලෙස වාසිදායක වන අන්දමින් භාණ්ඩ සහ තැනැත්තන් ප්‍රවාහනය කළ යුතු ය යන ජාතික අරමුණ ප්‍රවර්ධනය කිරීම ;

(ඇ) ජාතියේ යහපත උදෙසා මාර්ග දුම්රිය සම්බන්ධීකරණය සහ විරාය—දුම්රිය සම්බන්ධීකරණය අවශ්‍ය යයි සලකනු ලබන අවස්ථාවල දී එවැනි සම්බන්ධීකරණ ප්‍රවර්ධනය කිරීම ;

(ඈ) දුම්රිය අධිකාරිය සතු වී ඇති සියලු නිශ්චල දේපළ කාර්යක්ෂම ලෙස කළමනාකරණය කිරීම සහ එකී කර්තව්‍ය කිරීම සඳහා අවශ්‍ය නොවන එවැනි යම් දේපළක් ආණ්ඩුවට භාරදීම

දුම්රිය අධිකාරියේ වෙනත් කර්තව්‍ය විය යුතු ය.

6. ස්වකීය කර්තව්‍ය කිරීමේ කාර්යය සඳහා, දුම්රිය අධිකාරිය විසින් පහත සඳහන් බලතල ක්‍රියාත්මක කිරීම හා කාර්ය ඉටු කිරීම කළ යුතු ය :— දුම්රිය අධිකාරියේ බලතල හා කාර්ය

(අ) වෙනත් ප්‍රවාහන ක්‍රම විසින් සලස්වා ඇති සේවා සමග දුම්රිය අධිකාරිය විසින් සලස්වන සේවාවල තරඟකාරිත්වය සහතික කිරීම පිණිස යෝග්‍ය විය හැකි ආකාරයකින් දුම්රියෙන් භාණ්ඩ සහ තැනැත්තන් ප්‍රවාහනය කිරීම සඳහා ගාස්තු ක්‍රම, අනුප්‍රමාණ හා කාර්ය පටිපාටි නියම කිරීම ;

(ආ) (අ) ඡේදය යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී දුම්රිය අධිකාරිය විසින් නියම කරනු ලබන යම් අනුප්‍රමාණ හා ගාස්තුවට අඩු අනුප්‍රමාණ මත, එය විසින් ආණ්ඩුවේ යම් දෙපාර්තමේන්තුවකට, රාජ්‍ය සංස්ථාවකට, පළාත් සභාවකට හෝ පළාත් පාලන ආයතනයකට සලසනු ලබන සේවා කිසිවක් සඳහා ආණ්ඩුව සමග රාජ්‍ය සේවා බන්ධන ගිවිසුම්වලට ඇතුළත් වීම ;

(ඇ) දුම්රිය අධිකාරියේ කර්තව්‍ය කිරීම සඳහා අවශ්‍ය යම් නිලධරයන් හා සේවකයන් සේවයේ නියුක්ත කිරීම සහ සේවක සංඛ්‍යාව, ඒ නිලධරයන්ට හා සේවකයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමිකය හා ඔවුන්ට අදාළ සේවා නියම හා කොන්දේසි නිශ්චය කිරීම ;

(ඈ) දුම්රිය අධිකාරියේ කර්තව්‍ය කිරීම සඳහා අවශ්‍ය විය හැකි පරිදි කොන්ත්‍රාත්තුවලට සහ ගිවිසුම්වලට ඇතුළත් වීම ;

(ඉ) එක් එක් තනි දුම්රිය මාර්ග, වෙළඳ ද්‍රව්‍ය හා එහා මෙහා ගෙනයාම් සඳහා ස්ථාවර සහ විචල්‍ය පිරිවැය, දීර්ඝ කාලීන සහ කෙටි කාලීන ආන්තික පිරිවැය සහ වෙනත් උචිත පිරිවැය සංකල්ප ඇතුළුව, දුම්රිය අධිකාරිය විසින් සලස්වනු ලබන දුම්රිය සේවාවල සම්පූර්ණ පිරිවැය හැකි තාක් දුරට දැක්වෙන පිරිවැය ක්‍රමයක් විය යුතු, ස්වකීය වාණිජ අරමුණු සපුරාලීම පිණිස සැලසුම් කළ විධිමත් දුම්රිය පිරිවැය ක්‍රමයක් වර්ධනය කිරීම ;

(ඊ) දුම්රිය අධිකාරියේ නිලධරයන් සහ සේවකයන් පත් කිරීම, උසස් කිරීම, ඔවුන්ගේ පාරිශ්‍රමිකය, විනය පාලනය, නිවාඩු, ප්‍රසිද්ධ නිවාඩු සහ ඔවුන්ට ණය සහ වැටුප් අත්තිකාරම් දීම ද ඇතුළුව ඔවුන්ට අදාළ රීති සෑදීම ;

(උ) දුම්රිය අධිකාරියේ කටයුතු පරිපාලනය කිරීම සම්බන්ධයෙන් රීති සෑදීම සහ කාර්ය පටිපාටි නියම කිරීම ;

(ඌ) ආරක්ෂක සම්මතයක් ද ඇතුළුව, දුම්රිය සේවා සඳහා සම්මතයන් නියම කිරීම ;

(එ) දුම්රිය අධිකාරියේ කර්තව්‍ය කාර්යක්ෂමව කිරීම සඳහා පැවරීම අවශ්‍ය යයි මණ්ඩලය සලකන කර්තව්‍ය කිසිවක් මේ පනතේ වෙනත් විධිවිධානවලට යටත්ව දුම්රිය අධිකාරියේ සභාපතිවරයාට හෝ එහි යම් සාමාජිකයකුට හෝ නිලධරයකුට පැවරීම ;

(ඒ) දුම්රිය අධිකාරිය විසින් සේවයෙහි නියුක්ත කර සිටින නිලධරයන්ගේ සහ සේවකයන්ගේ සුභසිද්ධිය සඳහා රක්ෂණ ක්‍රමයක්, අර්ථසාධක අරමුදලක්, ශුභ සාධක අරමුදලක් පිහිටුවීම සහ ශුභ සාධක, සෞඛ්‍ය හා විනෝද ක්‍රීඩා පහසුකම් සැපයීම ;

(ඔ) යම් චංචල හෝ නිශ්චල දේපලක් අත්කර ගැනීම, දැරීම, බද්දට ගැනීම හෝ දීම, කුලියට ගැනීම, ඔඩපනය කිරීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම ;

(ඔ) දුම්රිය අධිකාරියේ කර්තව්‍ය කිරීම පිණිස අවශ්‍ය තැනැත්තන් පුහුණු කිරීම සඳහා පහසුකම් දුම්රිය අධිකාරිය විසින් සැපයීම හා වෙනත් තැනැත්තන් විසින් සපයනු ලැබීමට සහාය වීමද ඇතුළුව, දුම්රිය අධිකාරිය විසින් සේවයෙහි නියුක්ත කර සිටින නිලධරයන්ගේ සහ සේවකයන්ගේ කාර්යක්ෂමතාව හා නිපුණත්වය වැඩි දියුණු කිරීමේ හෝ දුම්රිය අධිකාරියේ උපකරණවල කාර්යක්ෂමතාව හෝ ඒ උපකරණ ක්‍රියා කරවනු ලබන ආකාරය හෝ වැඩි දියුණු කිරීමේ කාර්යය සඳහා ඕනෑම දෙයක් කිරීම.

දුම්රිය අධිකාරිය සම්බන්ධයෙන් අමාත්‍යවරයා සතු බලතල.

7. (1) ජාතික යහපත කෙරෙහි බලපාන බවට තමාට පෙනී යන කාරණා සම්බන්ධයෙන් මේ පනත යටතේ දුම්රිය අධිකාරිය සතු කාර්ය ඉටු කිරීම හා බලතල ක්‍රියාත්මක කිරීම පිළිබඳව අමාත්‍යවරයා විසින් ලියවිල්ලකින් දුම්රිය අධිකාරියට සාමාන්‍ය හෝ විශේෂ විධාන දිය හැකි අතර, දුම්රිය අධිකාරිය විසින් ඒ විධාන ක්‍රියාත්මක කළ යුතු ය.

(2) දුම්රිය අධිකාරියේ දේපළ හා කටයුතු පිළිබඳ වාර වාර්තා, ගිණුම් හා වෙනත් තොරතුරු තමා නියම කරන ආකෘතියකින් තමා වෙත සපයන ලෙස අමාත්‍යවරයා විසින් දුම්රිය අධිකාරියට කලින් කල විධාන කළ හැකි අතර, දුම්රිය අධිකාරිය විසින් ඒ සෑම විධානයක්ම ක්‍රියාත්මක කළ යුතු ය.

(3) දුම්රිය අධිකාරියේ සියලු කටයුතු හෝ ඉන් යම් කටයුත්තක් හෝ තමා විසින් නියම කරනු ලබන තැනැත්තකු හෝ තැනැත්තන් විසින් විමර්ශනය කොට, වාර්තා කරනු ලැබිය යුතු යයි අමාත්‍යවරයා විසින් කලින් කල නියම කරනු ලැබිය හැකි අතර, එවැනි නියමයක් කරනු ලැබූ විට, දුම්රිය අධිකාරිය විසින්, ඒ නියමය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විය හැකි සියලු පහසුකම් හා සියලු තොරතුරු සැපයීම කළ යුතු ය.

සභාපතිවරයා වෙත බලතල පැවරීම සහ සභාපතිවරයා විසින් නිලධරයන් හා සේවකයන්ට බලතල පැවරීම.

8. (1) මේ වගන්තියෙන් මණ්ඩලය වෙත පැවරී ඇති බලය හැර, මණ්ඩලය සතු බලතල, කර්තව්‍ය හෝ කාර්ය කිසිවක් මණ්ඩලය විසින් සභාපතිවරයාට ලියවිල්ලකින් පවරනු ලැබිය හැකි ය.

(2) සභාපතිවරයා, දුම්රිය අධිකාරියේ ගිණුම් පිළිබඳ නිලධරයා විය යුතු ය.

(3) සභාපතිවරයා විසින්, මණ්ඩලයේ ලිඛිත අනුමතය ඇතිව, (1) වන උපවගන්තිය යටතේ ඔහු වෙත පවරා දී ඇති බලතල, කර්තව්‍ය හෝ කාර්ය අතුරින් කිසිවක් දුම්රිය අධිකාරියේ යම් නිලධරයකුට හෝ සේවකයකුට ලියවිල්ලකින් පවරනු ලැබිය හැකි ය.

## II වන කොටස

### දුම්රිය අධිකාරියේ කාර්ය මණ්ඩලය

කළමනාකාර අධ්‍යක්ෂවරයා.

9. (1) මණ්ඩලය විසින්, දුම්රිය අධිකාරියේ කළමනාකාර අධ්‍යක්ෂවරයා වශයෙන් ප්‍රවීන හා පළපුරුදු තැනැත්තකු පත් කරනු ලැබිය යුතු ය.

(2) ප්‍රතිපත්තිමය කාරණා සම්බන්ධයෙන් මණ්ඩලයේ සාමාන්‍ය විධානයට හා සභාපතිවරයාගේ විශේෂ විධානවලට යටත්ව, කළමනාකාර අධ්‍යක්ෂවරයා දුම්රිය අධිකාරියේ කටයුතු මෙහෙයවීම සම්බන්ධයෙන් වගකිව යුතු අතර, ඔහු විසින් දුම්රිය අධිකාරියේ නිලධරයන් හා සේවකයන් විෂයයෙහි පරිපාලනමය පාලනය ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(3) කළමනාකාර අධ්‍යක්ෂවරයා විසින්, ස්වකීය බලතල, කර්තව්‍ය හෝ කාර්ය අතුරින් දුම්රිය අධිකාරියේ වෙනත් යම් නිලධරයකුට හෝ සේවකයකුට පැවරීම අවශ්‍ය යයි තමා කලින් කල සලකන බලතල, කර්තව්‍ය හෝ කාර්ය කිසිවක් මණ්ඩලයේ ලියවිල්ලකින් වූ අනුමතය ඇතිව, කළමනාකාර අධ්‍යක්ෂවරයා විසින් ලියවිල්ලකින් ඒ නිලධරයාට හෝ සේවකයාට පවරනු ලැබිය හැකි අතර, එවැනි යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් එසේ පවරනු ලැබූ යම් නිලධරයකු හෝ සේවකයකු විසින්, කළමනාකාර අධ්‍යක්ෂවරයාගේ සාමාන්‍ය හෝ විශේෂ විධානවලට යටත්ව, ඒ බලය ක්‍රියාත්මක කිරීම, කාර්ය ඉටු කිරීම හෝ කර්තව්‍ය කිරීම කළ යුතු ය.

(4) කළමනාකාර අධ්‍යක්ෂවරයාට ස්වකීය කාර්ය ඉටු කිරීම තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, ඔහුගේ ධුරයෙහි වැඩ බැලීම පිණිස මණ්ඩලය විසින් වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

ප්‍රධාන මුදල් කළමනාකාරවරයා.

10. (1) මණ්ඩලය විසින් සුදුසුකම් ලත්, ප්‍රවීන හා පළපුරුදු තැනැත්තකු දුම්රිය අධිකාරියේ ප්‍රධාන මුදල් කළමනාකාරවරයා වශයෙන් පත් කරනු ලැබිය යුතු ය.

(2) රුපියල් මිලියන දෙකක් ඉක්මවන ප්‍රමාණයක වියදම් සිදු වන මූල්‍ය ස්වභාවයේ වූ සියලු තීරණ, මුදල් කළමනාකාරවරයා විසින් වියදම් පිළිබඳ සියලු මූල්‍ය බලපෑම් දැක්වෙන මූල්‍ය විග්‍රහයක් මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබීමෙන් පසුව පමණක්, මණ්ඩලය විසින් ගනු ලැබිය යුතු ය.

නියමිත දින යට පෙර දුම්රිය දෙපාර්තමේන්තුවේ රජයේ නිලධරයන් විසින් නිවේදනයක් දිය යුතු බව.

11. පහත දැක්වෙන විධිවිධාන, දුම්රිය දෙපාර්තමේන්තුවේ රජයේ නිලධරයන් දුම්රිය අධිකාරියේ සේවයෙහි නියුක්ත කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය:—

(අ) ආණ්ඩුවේ ස්ථාන මාරු සහිත සේවයකට අයත් නොවන (ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ නිලධරයකු හැර) දුම්රිය දෙපාර්තමේන්තුවේ සෑම රජයේ නිලධරයකු විසින්, නියමිත දිනයේ දී—

(i) දුම්රිය දෙපාර්තමේන්තුවේ රජයේ නිලධරයකු ලෙස දිගට ම ධුරය දැරීමට ; හෝ

(ii) දුම්රිය දෙපාර්තමේන්තුවේ විශ්‍රාම වැටුප් සහිත නිලධරයකු වශයෙන්, ඒ දිනයේ දී ඔහු අවුරුදු දහයකට නොඅඩු විශ්‍රාම වැටුප් සහිත සේවයක් කර තිබේ නම්, රජයේ සේවයෙන් විශ්‍රාම ලබා ගෙන දුම්රිය අධිකාරියේ නිලධරයකු වීමට ; හෝ

(iii) දුම්රිය දෙපාර්තමේන්තුවේ විශ්‍රාම වැටුප් සහිත නිලධරයකු වශයෙන් ඒ දිනයේ දී ඔහු අවුරුදු දහයකට අඩු විශ්‍රාම වැටුප් සහිත සේවයක් ඉටු කර තිබේ නම්, රජයේ සේවයෙන් අස්වී, දුම්රිය අධිකාරයේ නිලධරයකු වීමට ; හෝ

(iv) ඔහු රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥාපනත යටතේ පිහිටුවන ලද රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ දායකයකු වේ නම්, රජයේ සේවයෙන් අස්වී, දුම්රිය අධිකාරියේ නිලධරයකු වීමට ; හෝ

(v) රජයේ සේවයෙන් විශ්‍රාම ලබා ගෙන හෝ අස්වී දුම්රිය අධිකාරියේ නිලධාරියකු නොවීමට

ඔහු අදහස් කරන බව නියමිත දිනයට පෙර ලියවිල්ලකින් දුම්රිය සාමාන්‍යාධිකාරීවරයා වෙත නිවේදනයක් කළ යුතු ය.

(ආ) (අ) ඡේදය යටතේ නියමිත දිනයට පෙර, දුම්රිය සාමාන්‍යාධිකාරීවරයා වෙත දුම්රිය දෙපාර්තමේන්තුවේ රජයේ නිලධරයකු විසින් දෙන ලද නිවේදනයක් අවසානාත්මක වන්නේ ය.

11 (අ) වගන්තිය යටතේ නිවේදන යක් නොදීමේ හෝ දීමේ ප්‍රතිඵලය.

**12.** (1) 11 වන වගන්තියේ (අ) ඡේදයේ (ii), (iii), (iv) හෝ (v) වන අනු ඡේදය යටතේ දිය යුතු නිවේදනය නියමිත දිනයට පෙර නොදෙන හෝ ඒ වගන්තියේ (අ) ඡේදයේ (i) වන අනු ඡේදය යටතේ දිය යුතු නිවේදනය දෙන දුම්රිය දෙපාර්තමේන්තුවේ යම් රජයේ නිලධරයකු, එම දිනයේ සිට හා ඉන් පසුව දුම්රිය දෙපාර්තමේන්තුවේ රජයේ නිලධරයකු ලෙස දිගටම ධුරය දැරිය යුතු ය.

(2) (1)වන උපවගන්තියේ සඳහන් රජයේ නිලධරයකු විසින්, ඔහු ඒ ධුරය දිගටම දරන තාක් කල්, ඒ නිලධරයාගේ තත්ත්වයෙන්, දුම්රිය අධිකාරිය සඳහා සහ වෙනුවෙන් වැඩ කළ යුතු අතර, ඒ නිලධරයාගේ තත්ත්වයෙන් දුම්රිය දෙපාර්තමේන්තුවට වැඩ කළ කාලයේ දී ඔහුට හිමිකම තිබුණු සේවා කොන්දේසිවලට ම ඔහු හිමිකම් ලබන්නේ ය ; තවද වෙනත් රජයේ නිලධරයකු යටතේ වන විනය පාලනයට ම ඔහු ද යටත් වන්නේ ය.

(3) දුම්රිය දෙපාර්තමේන්තුවේ යම් රජයේ නිලධරයකු, ඒ නිලධරයාගේ තත්ත්වයෙන්, නියමිත දින සහ ඉන් පසුව දුම්රිය අධිකාරිය සඳහා සහ වෙනුවෙන් වැඩ කරමින්, ඒ නිලධරයා වශයෙන් දිගට ම ධුරය දරන අවස්ථාවක, ඒ නිලධරයා සම්බන්ධයෙන් ආණ්ඩුව විසින් ගෙවිය යුතු විශ්‍රාම වැටුප් හෝ අර්ථසාධක අරමුදල් සඳහා දායක මුදල් ද ඇතුළුව, වැටුප් සහ වෙනත් වියදම් සඳහා ප්‍රමාණවත් මුදලක් ලෙස මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන මුදල් ප්‍රමාණයක් නොඉක්මවන යම් මුදලක් ඒකාබද්ධ අරමුදලට බැර කිරීම පිණිස දුම්රිය අධිකාරියේ මුදල්වලින් මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයාට දුම්රිය අධිකාරිය විසින් ගෙවනු ලැබිය යුතු ය.

11 වන වගන්තියේ (අ) ඡේදයේ (ii) සිට (v) දක්වා අනු ඡේද යටතේ නිවේදනයක් දීමේ ප්‍රතිඵලය.

**13.** (1) 11 වන වගන්තියේ (අ) ඡේදයේ (ii), (iii), (iv) හෝ (v) වන අනුඡේදය යටතේ නියමිත දිනයට පෙර නිවේදනයක් කරන දුම්රිය දෙපාර්තමේන්තුවේ යම් රජයේ නිලධරයෙක්—

(අ) ඔහු විසින් නිවේදනය දෙනු ලැබුවේ ඒ ඡේදයේ (ii) වන අනුඡේදය යටතේ නම්, නියමිත දින සිට සහ ඉන්පසුව, දුම්රිය අධිකාරියේ නිලධරයකු වන අතර, 14 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, නියමිත දිනයේදී ධුරය අහෝසි කිරීමේ හේතුව මත ඔහු රජයේ සේවයෙන් විශ්‍රාම ගනු ලැබුවේ නම්, විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ඔහුට ප්‍රදානය කරනු ලැබිය හැකිව තිබූ විශ්‍රාම වැටුප ම ලැබීමට ඔහු හිමිකම් ලබන්නේ ය ;

(ආ) ඔහු විසින් නිවේදනය දෙනු ලැබුවේ ඒ ඡේදයේ (iii) වන අනුඡේදය යටතේ නම්, නියමිත දින සිට සහ ඉන්පසුව, දුම්රිය අධිකාරියේ නිලධරයකු වන අතර, ඒ දිනයේ දී ඔහු රජයේ සේවයෙන් ඉවත් වූ ලෙස සලකනු ලබන්නේ ය. තවද, 14 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, නියමිත දිනයේ දී ධුරය අහෝසි කිරීමේ හේතුව මත ඔහු රජයේ සේවයෙන් ඉවත් වූයේ නම්, විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ඔහුට ප්‍රදානය කරනු ලැබිය හැකිව තිබූ ප්‍රදානය ම ලැබීමට ඔහු හිමිකම් ලබන්නේ ය ;

(ඇ) ඔහු විසින් නිවේදනය දෙනු ලැබුවේ ඒ ඡේදයේ (iv) වන අනුඡේදය යටතේ නම්, නියමිත දින සිට සහ ඉන් පසුව, දුම්රිය අධිකාරියේ නිලධරයකු වන අතර සේවයෙන් පහ කිරීමේ හේතුවෙන් නොව, නියමිත දිනයේ දී ආණ්ඩුවේ කැමැත්ත ඇතිව ගිවිසුමක් අවසාන කිරීමෙන් ඔහු ආණ්ඩුවේ සේවයෙන් ඉවත් වූ ලෙස රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥාපනතේ කාර්යය සඳහා සලකනු ලැබිය යුතු ය ; නැතහොත්

(ඈ) ඔහු විසින් නිවේදනය දෙනු ලැබුවේ ඒ ඡේදයේ (v) වන අනුඡේදය යටතේ නම්, සහ—

(i) ඔහු ඒ ඡේදයේ (ii) වන අනුඡේදයේ සඳහන් පංතියට හෝ විස්තරයට අයත් රජයේ නිලධරයකු නම්, නියමිත දිනයේ දී රජයේ සේවයෙන් විශ්‍රාම ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර, නියමිත දිනයේ දී ධුරය අහෝසි කිරීමේ හේතුව මත ඔහු රජයේ සේවයෙන් විශ්‍රාම ලැබුවේ නම්, විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ඔහුට ප්‍රදානය කරනු ලැබිය හැකිව තිබූ විශ්‍රාම වැටුපම ලැබීමට ඔහු හිමිකම් ලබන්නේ ය;

(ii) ඔහු ඒ ඡේදයේ (iii) වන අනුඡේදයේ සඳහන් පංතියට හෝ විස්තරයට අයත් රජයේ නිලධරයකු නම්, නියමිත දිනයේ දී රජයේ සේවයෙන් ඉවත් වූ ලෙස සලකනු ලැබිය යුතු අතර, නියමිත දිනයේ දී ධුරය අහෝසි කිරීමේ හේතුව මත ඔහු රජයේ සේවයෙන් ඉවත් වූයේ නම්, විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ඔහුට ප්‍රදානය කරනු ලැබිය හැකිව තිබූ ප්‍රදානයම ලැබීමට ඔහු හිමිකම ලබන්නේය; නැතහොත්

(iii) ඔහු ඒ ඡේදයේ (iv) වන අනුඡේදයේ සඳහන් පංතියට හෝ විස්තරයට අයත් නිලධරයකු නම්, සේවයෙන් පහ කිරීමේ හේතුව මත නොව, ආණ්ඩුවේ කැමැත්ත ඇතිව ගිවිසුමක් අවසාන කිරීමෙන් ඔහු නියමිත දිනයේ දී ආණ්ඩුවේ සේවයෙන් ඉවත් වූ ලෙස රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥාපනතේ කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන සහ 12 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන සහ මේ පනතේ වෙනත් යම් විධිවිධාන අතර යම් ගැටුමක් හෝ අනනුකූලතාවක් ඇති වූ විටක, ඒ ගැටුමේ හෝ අනනුකූලතාවේ ප්‍රමාණයට, ඒ උපවගන්තිවල විධිවිධාන ඒ වෙනත් විධිවිධාන අභිබවා බලපවත්වන්නේ ය.

14. 13 වන වගන්තියේ විධිවිධාන ක්‍රියාත්මක වීම නිසා නියමිත දිනයේ දී දුම්රිය අධිකාරියේ නිලධරයකු බවට පත් වූ යම් නිලධර යකුට සහ ඒ නිලධරයාට පහත දැක්වෙන විධිවිධාන අදාළ වන්නේ ය: —

දුම්රිය අධිකාරි යේ ඇතැම් නිලධරයන්ට අදාළ වන විශේෂ විධි විධාන.

(අ) ඒ නිලධරයා සහ දුම්රිය අධිකාරිය එකඟ වන නියම හා කොන්දේසි මත ඒ නිලධරයා දුම්රිය අධිකාරිය විසින් සේවයෙහි නියුක්ත කළ යුතු ය.:

එසේ වුව ද ඒ නියම හා කොන්දේසි, ඒ නිලධරයා දුම්රිය දෙපාර්තමේන්තුවේ කලින් සේවයෙහි නියුක්ත කරනු ලැබුවේ යම් නියම හා කොන්දේසි මත ද, ඒ නියම හා කොන්දේසිවලට වඩා අඩුවෙන් වාසිදායක නොවිය යුතු ය ;

(ආ) නියමිත දිනයේ දී ඒ නිලධරයා දුම්රිය දෙපාර්තමේන්තුවේ විශ්‍රාම වැටුප් සහිත තනතුරක් වශයෙන් ප්‍රකාශිත තනතු රක් දරමින් සිටි සහ අවුරුදු දහයකට අඩු නමුත් අවුරුදු අටකට නොඅඩු විශ්‍රාම වැටුප් සහිත සේවයක් කර ඇති රජයේ නිලධරයකු නම්—

(i) ආඥාපනත යටතේ වූ ඔහුගේ විශ්‍රාම වැටුප් සහිත සේවා කාලයට යම් කාලයක් එකතු කළ විට අවුරුදු දහයක සමස්ත විශ්‍රාම වැටුප් සහිත සේවා කාලසීමාවක් සම් පූර්ණ වන විටක ඒ කාලසීමාව දක්වා ඔහු නියමිත දිනයට ඉහතින් වූ දිනයේදී දුම්රිය දෙපාර්තමේන් තුවේ දැරූ තනතුර දරමින් සිටි ලෙස විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ කාර්යය සඳහා පමණක් සලකනු ලැබිය යුතු ය. (ඒ සමස්ත කාලසීමාව ආගණනය කිරීම සඳහා, දුම්රිය අධිකාරිය යටතේ සේවය ආඥාපනත යටතේ විශ්‍රාම වැටුප් සහිත සේව යක් ලෙස සලකනු ලැබිය යුතු ය.) ;

(ii) නියමිත දිනයට ඉහතින් වූ දිනයේ දී ඔහු දුම්රිය දෙපාර්තමේන්තුවේ දැරූ තනතුර යම් කාලසීමා වක් තුළ ඔහු දැරූ බවට විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ කාර්ය සඳහා සලකනු ලබන විට, ඒ කාලසීමාවේ එක් එක් සම්පූර්ණ මාසය වෙනු වෙන් මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන මුදලක් ඔහු සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ අරමුදලට බැර කිරීම සඳහා දුම්රිය අධිකාරියේ මුදල්වලින් දුම්රිය අධිකාරිය විසින් මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් වරයා වෙත ගෙවනු ලැබිය යුතු ය ; තවද

(iii) (i) වන අනුඡේදයේ සඳහන් කාලසීමාව අවසානයේ දී ඔහු රජයේ සේවයෙන් විශ්‍රාම ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ කාලසීමාව අවසානයේ දී තන තුර අහෝසි කිරීමේ හේතුව මත ඔහු රජයේ සේවයෙන් විශ්‍රාම ලැබුවේ නම්, විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ඔහුට ප්‍රදානය කරනු ලැබිය හැකිව තිබූ විශ්‍රාම වැටුපම ලැබීමට ඔහු හිමිකම ලබන්නේ ය ;

(iv) මේ ඡේදය යටතේ විශ්‍රාම වැටුපක් සඳහා සුදුසුකම් ලබන දුම්රිය අධිකාරියේ යම් නිලධරයකු 13 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ වූ ප්‍රදානයකට සුදුසුකම් නොලැබිය යුතු ය ;

(ඇ) මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන්ව ඇතද, 13 වන වගන්තියේ විධිවිධාන ක්‍රියාත්මක වීම නිසා දුම්රිය දෙපාර්තමේන්තුවේ රජයේ නිලධරයකු දුම්රිය අධිකාරියේ සේවා නියුක්තයකු බවට පත්වන අවස්ථාවක—

(i) නියමිත දිනයේදී හෝ ඊට පසුව විශ්‍රාම වැටුපකට ඒ නිලධරයා සුදුසුකම් ලැබුවේ නම් සහ ඔහුගේ යම් පූර්ණ විශ්‍රාම වැටුප ලබා ගැනීමට ඔහු තීරණය කළ හොත් දුම්රිය අධිකාරියේ ඔහුගේ සේවා නියුක්ති කාලය ඇතුළත එම විශ්‍රාම වැටුප ඔහුට ගෙවනු නොලැබිය යුතු ය ;

(ii) ඒ නිලධරයා විශ්‍රාම වැටුපකට සුදුසුකම් ලබා තිබේ නම් සහ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2අ (1) (i) වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව, ඔහුගේ විශ්‍රාම වැටුපෙන් හතරෙන් එක කොටසක් පාරිතෝෂිකයක් ලෙස ලබා ගැනීමට තීරණය කළහොත්—

(අ) ඒ පාරිතෝෂිකය ඔහුට ගෙවනු නොලැබිය යුතු අතර එය දුම්රිය අධිකාරියේ අනුමත අර්ථසාධක අරමුදලක ඔහුගේ ගිණුමට බැර කළ යුතු ය ;

(ආ) එකී ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ඔහුට ගෙවිය යුතු විශ්‍රාම වැටුපේ ඉතිරි හතරෙන් තුන් කොටස ඔහු දුම්රිය අධිකාරියේ සේවයෙහි නියුක්තව සිටින කාලය තුළ ඔහුට ගෙවනු නොලැබිය යුතු ය ;

(ඇ) එකී ව්‍යවස්ථා සංග්‍රහයේ 2අ (1) (ii) වන වගන්තියේ සඳහන් "ඔහු විශ්‍රාම ලැබූ දිනයේ සිට අවුරුදු දහයක" කාලසීමාව ගණන් බැලීමේ කාර්යය සඳහා, ඔහු විශ්‍රාම ලැබූ දිනය ඔහු දුම්රිය අධිකාරියේ සේවයෙහි නියුක්තව සිටි අවසාන දිනය ලෙස සලකනු ලැබිය යුතු ය ;

(iii) ඒ නිලධරයා විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුපකට නොව පාරිතෝෂිකයකට හිමිකම් ලබන්නේ නම්, ඒ පාරිතෝෂිකය දුම්රිය අධිකාරියේ ඔහු සේවයෙහි නියුක්තව සිටින කාලය තුළ ඔහුට ගෙවනු නොලැබිය යුතු නමුත්, එය දුම්රිය අධිකාරියේ අනුමත අර්ථසාධක අරමුදලක ඔහුගේ ගිණුමට බැර කළ යුතු ය ; තව ද

(iv) රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල්, ආඥාපනත යටතේ යම් මුදල් ප්‍රමාණයක් ලැබීමට ඒ නිලධරයා හිමිකම් ලබන්නේ නම්, ඒ මුදල දුම්රිය අධිකාරියේ ඔහු සේවයෙහි නියුක්තව සිටින කාලය තුළ ඔහුට ගෙවනු නොලැබිය යුතු නමුත් එය දුම්රිය අධිකාරියේ අනුමත අර්ථසාධක අරමුදලක ඔහුගේ ගිණුමට බැර කළ යුතු ය.

**දුම්රිය දෙපාර්තමේන්තුවේ රජයේ නිලධරයන් වශයෙන් ඒ තත්ත්වයෙන් දුම්රිය අධිකාරිය සඳහා සහ වෙනුවෙන් කාර්ය ඉටුකරන අතරම, නියමිත දිනයේ දී හා ඉන් පසුව දුම්රිය දෙපාර්තමේන්තුවේ රජයේ නිලධරයන් වශයෙන් දිගටම සේවය කරන ඇතැම් තැනැත්තන්ට අදාළවන විශේෂ විධිවිධාන.**

15. (1) දුම්රිය දෙපාර්තමේන්තුවේ රජයේ නිලධරයකු වශයෙන් වූ තමාගේ තත්ත්වයෙන් නියමිත දිනයේ දී හා ඉන් පසුව දුම්රිය අධිකාරිය සඳහා සහ වෙනුවෙන් කාර්ය ඉටු කරන අතරම නියමිත දිනයේ දී සහ ඉන්පසුව දුම්රිය දෙපාර්තමේන්තුවේ ඒ රජයේ නිලධරයා වශයෙන් නම තනතුර නොකඩවා දරන යම් තැනැත්තකු, කවර හෝ අවස්ථාවක දී, දුම්රිය අධිකාරියේ කාර්ය මණ්ඩලයට, ඔහුගේ කැමැත්ත ඇතිව ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(2) යම් රජයේ නිලධරයකු (1) වන උපවගන්තිය යටතේ දුම්රිය අධිකාරියේ කාර්ය මණ්ඩලයට පත් කරනු ලැබූ අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනා ගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඔහුට හා ඔහු හා සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

## III වන කොටස

### දුම්රිය අධිකාරියේ දේපළ

**දුම්රිය දෙපාර්තමේන්තුවේ සියලු දේපළ දුම්රිය අධිකාරියට පැවරීම.**

16. (1) (දුම්රිය දෙපාර්තමේන්තුව විසින් සවි කරන ලද හෝ නඩත්තු කරනු ලබන සියලු ස්ථාපන, පිරියත, යන්ත්‍රෝපකරණ සහ උපකරණ, දුම්රිය සේවා සැපයීම සඳහා දුම්රිය දෙපාර්තමේන්තුව විසින් පාවිච්චි කරනු ලබන කවර හෝ විස්තරයකට අයත් සියලු දේ සහ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රයෝජනය සඳහා පාර්ලිමේන්තුව විසින් වෙන්කර දෙන ලද මුදල් අතුරින් නියමිත දිනයට ඉහතින්ම වූ දිනයේ දී දුම්රිය දෙපාර්තමේන්තුවේ බැරට පවත්නා මුදල් ඇතුළුව) නියමිත දිනයට ඉහතින්ම වූ දිනයේ දී, රජය සතුව ඇත්තා වූ ද, දුම්රිය දෙපාර්තමේන්තුවේ කාර්ය සඳහා පාවිච්චි කරනු ලබන්නා වූ ද, සියලු චංචල හා නිශ්චල දේපළ නියමිත දිනයේ සිට දුම්රිය අධිකාරිය සතු විය යුතු ය.

(2) (5) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, දුම්රිය සාමාන්‍යාධිකාරිවරයා විසින් හෝ දුම්රිය සාමාන්‍යාධිකාරිවරයා සමග රජය සඳහා හෝ ඒ වෙනුවෙන් ඇතුළත් වූ සහ නියමිත දිනයට ඉහතින්ම වූ දිනයෙහි බලපවත්නා වූ සියලු ගිවිසුම්, නියමිත දිනයේ සිට දුම්රිය අධිකාරිය විසින් හෝ දුම්රිය අධිකාරිය සමග ඇතුළත් වූ ගිවිසුම් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව, බලාත්මක කරනු ලැබිය හැකි ය.

(3) දුම්රිය සාමාන්‍යාධිකාරිවරයා විසින් හෝ ඔහුට විරුද්ධව හෝ දුම්රිය සාමාන්‍යාධිකාරිවරයා නියෝජනය කරමින් නීතිපතිවරයා විසින් හෝ නීතිපතිවරයාට විරුද්ධව පවරා ඇත්තා වූ ද, නියමිත දිනයට පෙරාතුවම වූ දිනයෙහි විනිශ්චයට භාජනයව පවත්නා වූ ද සියලු නඩු හා නඩු කටයුතු නියමිත දිනයේ සිට බලපැවැත්වෙන පරිදි දුම්රිය අධිකාරිය විසින් හෝ ඊට විරුද්ධව පවරන ලද නඩු හා නඩු කටයුතු ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව ඒවා දිගටම පවත්වාගෙන ගොස් අවසන් කරනු ලැබිය හැකි ය.

(4) දුම්රිය සාමාන්‍යාධිකාරිවරයා විසින් හෝ ඔහුට විරුද්ධව හෝ දුම්රිය සාමාන්‍යාධිකාරිවරයා නියෝජනය කරමින් නීතිපතිවරයා විසින් හෝ ඔහුට විරුද්ධව පවරා ඇති යම් නඩුවකදී හෝ නඩු කටයුත්තක දී යම් අධිකරණයක් හෝ විනිශ්චයාධිකාරයක් විසින් ඇතුළත් කරනු ලැබ ඇති හෝ කරනු ලැබ ඇති, සහ නියමිත දිනයට පෙරාතුවම වූ දිනයේ දී ඉටු නොකර ඇති සියලු තීන්දු ප්‍රකාශ සහ ප්‍රදාන, නියමිත දිනයේ සිට බලපැවැත්වෙන පරිදි, දුම්රිය අධිකාරිය වෙත හෝ ඊට විරුද්ධව ඇතුළත් කරනු ලැබූ හෝ කරනු ලැබූ හෝ තීන්දු ප්‍රකාශ හෝ ප්‍රදාන ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව බලාත්මක කරනු ලැබිය හැකි ය.

(5) (දුම්රිය සාමාන්‍යාධිකාරිවරයා විසින් ශ්‍රී ලංකා ආණ්ඩුව සඳහා හා වෙනුවෙන් වෙනත් යම් විදේශ ආණ්ඩුවක් සමග හෝ විදේශ සංවිධානයක් සමග ඇතුළත් වූ යම් ගිවිසුමක් යටතේ දැරීමට යෙදුණා වූ ද, නියමිත දිනයේ දී පවත්නා වූද, යම් බැඳීම් නොවන) දුම්රිය සාමාන්‍යාධිකාරිවරයා විසින් රජය සඳහා සහ ඒ වෙනුවෙන් දරන ලද්දා වූ ද, නියමිත දිනයට ඉහතින් වූ දිනයෙහි පවත්නා වූ ද, සියලු බැඳීම්, දුම්රිය අධිකාරියේ බැඳීම් ලෙස නියමිත දිනයේ සිට සලකනු ලැබිය යුතු ය.

(6) (දුම්රිය ආඥාපනත හැර) යම් ලිඛිත නීතියකින් දුම්රිය සාමාන්‍යාධිකාරිවරයා වෙත පවරන ලද හෝ නියම කරන ලද හෝ වෙන් කර දෙන ලද සෑම බලයක්, කාර්යයක් සහ කර්තව්‍යයක් ම නියමිත දිනයේ සිට දුම්රිය අධිකාරිය විසින් ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හා කිරීම කළ යුතු අතර දුම්රිය සාමාන්‍යාධිකාරිවරයාට අදාළව කළ යුතු බවට ඒ වෙනත් යම් ලිඛිත නීතියකින් නියම කරනු ලැබ ඇති යම් ක්‍රියාවක් නියමිත දිනයේ සිට දුම්රිය අධිකාරියට අදාළව කරනු ලැබිය යුතුය: එමෙන්ම එවැනි වෙනත් ලිඛිත නීතියක "දුම්රිය සාමාන්‍යාධිකාරිවරයා" සම්බන්ධයෙන් වූ සෑම සඳහනක්ම නියමිත දිනයේ සිට "ශ්‍රී ලංකා දුම්රිය අධිකාරිය" සම්බන්ධයෙන් කරන ලද සඳහනක් ලෙස සලකනු ලැබිය යුතු ය.

**17.** (1) රජයේ ඉඩම් ආඥාපනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන්ව ඇත ද, දුම්රිය අධිකාරියේ කර්තව්‍ය ඉටු කිරීමේ කාර්ය සඳහා යම් රජයේ ඉඩමක් දුම්රිය අධිකාරියට අවශ්‍ය යයි අමාත්‍යවරයා සලකන අවස්ථාවක, අමාත්‍යවරයා විසින්, ඉඩම් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව ගැසට් පත්‍රයේ පළ කරනු ලබන (මින් මතු මේ පනතේ "සතු කිරීමේ නියමය" යනුවෙන් සඳහන් කරනු ලබන) නියමයක් මගින් ඒ නියමයෙහි සඳහන් කරනු ලැබිය හැකි යම් සීමාකිරීම් හෝ කොන්දේසි ඇතොත් ඒ සීමාකිරීම්වලට හා කොන්දේසිවලට යටත්ව එකී නියමයෙහි සඳහන් දිනයක සිට ඒ ඉඩම දුම්රිය අධිකාරිය සතු කරනු ලැබිය හැකි ය. රජයේ ඉඩම් දුම්රිය අධිකාරිය සතු කිරීමට අමාත්‍යවරයාට ඇති බලය.

(2) සතු කිරීමේ නියමයක, එහි සඳහන් යම් ඉඩමක් පිළිබඳ පරම අයිතිය, සියලු බැඳීම්වලින් තොරව, ඒ නියමයෙහි සඳහන් කරනු ලබන සීමාකිරීම් හා කොන්දේසිවලට යටත්ව, දුම්රිය අධිකාරියට ලබාදීමේ බලපෑම තිබිය යුතු ය.

**18.** (1) දුම්රිය අධිකාරියේ කාර්ය සඳහා රජය සතුව ඇති නිශ්චල දේපළක් නොවන වෙනත් යම් නිශ්චල දේපළක් අවශ්‍ය වී ඇත්තා වූ ද, එකඟවීමකින් ඒ දේපළ මිලට ගැනීමට දුම්රිය අධිකාරියට නොහැකි වන්නා වූ ද අවස්ථාවක, යෝජිත අත්කර ගැනීම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබුවහොත්, ඒ දේපළ මහජන කාර්යයක් සඳහා අවශ්‍ය දේපළක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ දේපළ ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අත්කර ගෙන ඒ පනත යටතේ දුම්රිය අධිකාරිය වෙත පවරනු ලැබිය හැකි ය. ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ දුම්රිය අධිකාරිය සඳහා නිශ්චල දේපළ අත්කර ගැනීම.

(2) ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ යම් නිශ්චල දේපළක් රජය විසින් අත්කර ගැනීම සම්බන්ධයෙන් ගෙවිය යුතු වන යම් මුදලක්, දුම්රිය අධිකාරිය විසින් ගෙවනු ලැබිය යුතු ය.

## IV වන කොටස

## මුදල්

**19.** (1) දුම්රිය අධිකාරියට, එහිම අරමුදලක් තිබිය යුතු ය. දුම්රිය අධිකාරියේ අරමුදල.

(2) දුම්රිය අධිකාරියේ අරමුදලට—

(අ) දුම්රිය අධිකාරියේ ප්‍රයෝජනය සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කල සම්මත කරනු ලැබිය හැකි සියලු මුදල් ;

(ආ) මේ පනත යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමෙහි ලා, කර්තව්‍ය ඉටු කිරීමෙහි ලා හා කාර්ය කිරීමෙහි ලා දුම්රිය අධිකාරියට ලැබෙන සියලු මුදල් ; සහ

(ඇ) මේ පනතේ යම් විධිවිධානයක් ක්‍රියාත්මක වීමේ හේතුවෙන් දුම්රිය අධිකාරිය සතුවන සියලු මුදල්

ගෙවනු ලැබිය යුතු ය.

(3) මේ පනතින යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමෙහි ලා, කර්තව්‍ය ඉටුකිරීමෙහි ලා හා කාර්ය කිරීමෙහි ලා දුම්රිය අධිකාරිය විසින් දරනු ලබන සියලු වියදම් පියවීම සඳහා අවශ්‍ය සියලු මුදල් දුම්රිය අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

දුම්රිය අධිකාරියේ ස්කන්ධ.

20. (1) මේ පනතින යටතේ ස්වකීය කර්තව්‍ය ඉටු කිරීම සඳහා දුම්රිය අධිකාරියට අවශ්‍ය වන යම් මුදල් ප්‍රමාණයක් ලබා ගැනීමේ කාර්යය සඳහා දුම්රිය අධිකාරිය විසින් ස්කන්ධ කිසිවක් ඇති කිරීම හා නිකුත් කිරීම කරනු ලැබිය හැකි ය. එසේ ඇති කොට නිකුත් කරනු ලබන ස්කන්ධ මෙහි මින් මතු "දුම්රිය අධිකාරියේ ස්කන්ධ" යනුවෙන් සඳහන් කරනු ලැබිය යුතු ය.

(2) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව, දුම්රිය අධිකාරිය විසින් නිශ්චය කරනු ලබන නියමවලට අනුකූලව දුම්රිය අධිකාරියේ ස්කන්ධ නිකුත් කිරීම, පැවරීම, ඒ සම්බන්ධයෙන් ක්‍රියා කිරීම, නිදහස් කිරීම සහ අවලංගු කිරීම කරනු ලැබිය යුතු ය.

ආණ්ඩුවේ ඇපවීම.

21. (1) මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, 20 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ඇති කොට නිකුත් කරනු ලබන යම් දුම්රිය අධිකාරියේ ස්කන්ධයක හෝ දුම්රිය අධිකාරිය විසින් ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත යම් තැනැත්තකුගෙන් ලබාගනු ලබන වෙනත් යම් ණයක, මුල් මුදල ආපසු ගෙවීම සහ ඒ වෙනුවෙන් වූ පොලිය ගෙවීම සම්බන්ධයෙන් ඇපවිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සපයන ලද ඇපයක් ඉටු කිරීම සඳහා අවශ්‍ය වන යම් මුදලක්, පාර්ලිමේන්තුවේ පූර්ව අනුමතය ඇතිව ඒකාබද්ධ අරමුදලින් ගෙවනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සපයන ලද ඇපයක් ඉටු කිරීමෙහි ලා ඒකාබද්ධ අරමුදලින් ගෙවනු ලැබූ යම් මුදලක්, ඒ වෙනුවෙන් වූ පොලියත් සමග, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව නිශ්චය කරනු ලබන යම් ප්‍රමාණයක් අනුව මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව නිශ්චය කරනු ලබන යම් ආකාරයකින් හා කාලයක් තුළ දී දුම්රිය අධිකාරිය විසින් ආපසු ගෙවනු ලැබිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ ඇපයක් සපයනු ලැබීමෙන් ඉක්බිතිව ම මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් ඒ ඇපවීම පිළිබඳ ප්‍රකාශයක් පාර්ලිමේන්තුව ඉදිරියෙහි තබනු ලැබිය යුතු ය; නැතහොත් එසේ තැබීමට සලස්වනු ලැබිය යුතු ය.

(5) (1) වන උපවගන්තිය යටතේ සපයන ලද ඇපයක් ඉටු කිරීමෙහි ලා (2) වන උපවගන්තිය යටතේ ඒකාබද්ධ අරමුදලින් යම් මුදලක් ගෙවනු ලැබූ අවස්ථාවක, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් නොපමාව ම ඒ ඇපවීම පිළිබඳ ප්‍රකාශයක් පාර්ලිමේන්තුව ඉදිරියෙහි තබනු ලැබිය යුතු ය; නැතහොත් එසේ තැබීමට සලස්වනු ලැබිය යුතු ය.

22. මේ පනතේ පසුව දැක්වෙන විධිවිධානවලින් ප්‍රකාශිතවම කර ඇති යම් විධිවිධානයකට යටත්ව, 1971 අංක 38 දරන මුදල් පනතේ II වන කොටසේ විධිවිධාන දුම්රිය අධිකාරියේ මුදල් පාලනයට හා ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන අදාළ කිරීම.

23. අමාත්‍යවරයාගේ සහ මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව නැතහොත් එලෙසම එකඟත්වය ඇතිව දෙන ලද යම් පොදු අධිකාරයක නියමවලට අනුව, මේ පනත යටතේ ස්වකීය කර්තව්‍ය ඉටු කිරීමේ කාර්යය සඳහා මණ්ඩලයට අවශ්‍ය විය හැකි මුදල් ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත අයිරා මාර්ගයෙන් හෝ අන්‍යාකාරයෙන් මණ්ඩලය විසින් ණයට ගනු ලැබිය හැකි ය ;

එසේ වුව ද මේ වගන්තිය යටතේ මණ්ඩලය විසින් ගන්නා ලද යම් ණය මුදල් සම්බන්ධයෙන් නොගෙවා ඉතිරිව ඇති මුදල් ප්‍රමාණයේ එකතුව, කිසිදු අවස්ථාවක දී, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් මුදලක් නොඉක්ම විය යුතු ය.

මණ්ඩලයේ ණය ගැනීමේ බලතල.

24. විෂය මූල සහ යථාර්ථ නිරූපිත ආර්ථික ඇගයීමකින් පසුව හැර, මණ්ඩලය විසින් කිසිම ප්‍රාග්ධන ආයෝජනයක් කරනු නොලැබිය යුතු ය. යෝජිත ආයෝජනයෙන් ප්‍රාග්ධනය මත නිසි පෙරළා ලැබීමක් සලස්වන ආදායමක් උපදවන බව ඒ ඇගයීමෙන් තීරණාත්මකවම පෙන්නුම් කරන්නේ නම් මිස, එවැනි කිසිම ආයෝජනයක් නොකළ යුතු ය.

ප්‍රාග්ධන ආයෝජන.

25. ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලැබෙන ආදායම ද ඇතුළුව ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමෙහි ලා හා කාර්ය ඉටුකිරීමෙහි ලා ලැබෙන සහ උපචිත වන මුදල්වලින් සමන්විත වන්නා වූ යම් මුදල් වර්ෂයක දුම්රිය අධිකාරියේ ආදායම, පහත දැක්වෙන අධිභාර ගෙවීම සඳහා අදාළ කර ගනු ලැබිය යුතු ය :—

(අ) ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීම හා කාර්ය ඉටු කිරීම සම්බන්ධයෙන් දුම්රිය අධිකාරිය විසින් දරන්නට යෙදෙන්නා වූ ද ආදායම් ගිණුමට නිසි ලෙස වැයභාරයක් වන්නා වූ ද කාරක සහ ආයතන වියදම් ;

(ආ) මේ පනතේ විධිවිධාන යටතේ දුම්රිය අධිකාරිය විසින් ලබාගන්නා ලද යම් ණය මුදල් මත පොළිය ; සහ

(ඇ) යම් ලිඛිත නීතියක් යටතේ වූ බදු.

දුම්රිය අධිකාරියේ ආදායම අදාළ කිරීම.

26. 25 වන වගන්තියේ සඳහන් අධිභාර ගෙවීමෙන් පසු දුම්රිය අධිකාරියේ ආදායමින් යම් වර්ෂයක් සඳහා ශුද්ධ අතිරික්තයක් වේනොත්, ඒ ශුද්ධ අතිරික්තය, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, දෙන ලද අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව, පහත සඳහන් කාර්ය අතුරින් යම් කාර්යයක් සඳහා හෝ ඒ කාර්ය සියල්ලම සඳහා මණ්ඩලය විසින් විසර්ජනය කළ හැකි ය :—

(අ) දුම්රිය අධිකාරිය පිහිටුවීමේ දී දරන ලද මූලික වියදම් කපා හැරීම ;

දුම්රිය අධිකාරියේ ශුද්ධ අතිරික්ත ආදායම විසර්ජනය කිරීම.

(ආ) ඉදිරියට ගෙනෙන ලද යම් සංචිත අලාභ කපා හැරීම ;

(ඇ) ආදායමට නිසි ලෙස වැය බරක් කළ නොහැකි ඵලදායි නොවන වියදමක් කපා හැරීම ;

(ඈ) මෙයින් පිහිටුවා පවත්වා ගෙනයාමට මණ්ඩලයට බලය දෙනු ලබන රක්ෂණ සංචිතයට මාරු කිරීම ;

(ඉ) මෙයින් පිහිටුවා පවත්වා ගෙනයාමට මණ්ඩලයට බලය දෙනු ලබන වත්කම්, ප්‍රතියෝජන සංචිතයට මාරු කිරීම ;

(ඊ) මෙයින් පිහිටුවා පවත්වා ගෙනයාමට මණ්ඩලයට බලය දෙනු ලබන ණය, බේරුම් කිරීමේ සංචිතයට මාරු කිරීම ;

(උ) මෙයින් පිහිටුවා පවත්වාගෙන යාමට මණ්ඩලයට බලය දෙනු ලබන යම් සංවර්ධන සංචිතයකට මාරු කිරීම ;

(ඌ) නිකුත් කර ඇති සහ නොගෙවා ඉතිරිව ඇති දුම්රිය අධිකාරියේ ස්කන්ධ මත (ඒවා නිදහස් කිරීමද ඇතුළුව) පොලිය සහ වෙනත් අධිභාර ගෙවීම.

**දුම්රිය අධිකාරියේ සංචිත ක්‍රියා කරවීම.**

27. මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව දෙන ලද අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව හැර, 26 වන වගන්තිය යෙහි සඳහන් සංචිතවලට එරෙහිව හරකිරීම් හෝ ඒවායින් පිට තට මාරුකිරීම් මණ්ඩලය විසින් කරනු නොලැබිය යුතු ය.

**ගිණුම.**

28. (1) දුම්රිය අධිකාරියේ ආදායම හා වියදම පිළිබඳව සහ එහි වෙනත් සියලු ගණුදෙනු පිළිබඳව විධිමත් ගිණුම් තබා ගැනීමට මණ්ඩලය විසින් කටයුතු සැලැස්විය යුතු අතර, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් කලින් කල සඳහන් කරනු ලැබිය හැකි ආයතනයකින් සහ විස්තර ඇතුළත් දුම්රිය අධිකාරියේ කටයුතුවලට අදාළ වූ ගිණුම් සහ සංඛ්‍යා ලේඛන පිළිබඳ වාර්ෂික ප්‍රකාශයක් ද මණ්ඩලය විසින් පිළියෙල කරනු ලැබිය යුතු ය.

(2) යොදා ගනු ලබන ගිණුම් ක්‍රමය, දුම්රිය පිරිවැය ක්‍රමය සඳහා අතීත තොරතුරු ඇත ගැනීමට සලස්වනු පිණිස සැලසුම් කරන ලද්දක් විය යුතු ය. ඒ පිරිවැය ක්‍රමය යුක්ති සහගත මිල කිරීමේ සහ අලෙවි කිරීමේ තීරණ ගැනීමට හැකිවනු පිණිස ස්ථාවර සහ විචල්‍ය පිරිවැය, දීර්ඝ කාලීන හා කෙටි කාලීන විචල්‍ය පිරිවැය සහ එක් එක් තනි මාර්ග සඳහා සහ බඩුමුට්ටු සහ එහා මෙහා ගමන් කිරීම සඳහා යෝග්‍ය වෙනත් පිරිවැය සංකල්ප ඇතුළත් දුම්රිය ධාවන ක්‍රියාකාරිත්වයේ පූර්ණ පිරිවැය නිශ්චය කිරීම පිණිස සැල සුම් කරනු ලැබිය යුතු ය.

**ගිණුම් විගණනය කිරීම.**

29. (1) දුම්රිය අධිකාරියේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන දුම්රිය අධිකාරියේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

30. (1) යම් වර්ෂයක් සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාව ලැබුණු පසු මණ්ඩලය විසින් ඒ වර්ෂයට අදාළ පහත දැක්වෙන ලේඛනවල පිටපත බැගින් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය:— වාර්ෂික වාර්තාව.

(අ) විගණකාධිපතිවරයාගේ වාර්තාව;

(ආ) විගණනය කරන ලද ශේෂ පත්‍රය;

(ඇ) විගණනය කරන ලද ක්‍රියාත්මක සහ ලාභාලාභ ගිණුම්;

(ඈ) මුදල් ලැබීමේ ප්‍රකාශය;

(ඉ) 28 වන වගන්තිය යටතේ සකස් කරන ලද ගිණුම් ප්‍රකාශය සහ සංඛ්‍යා ලේඛන; සහ

(ඊ) දුම්රිය අධිකාරියේ වැඩ පිළිබඳ විස්තරයක් දක්වන මණ්ඩලයේ සභාපතිවරයාගේ වාර්තාව.

(2) (1) වන උපවගන්තිය යටතේ තමා වෙත ඉදිරිපත් කරන ලද ලේඛනවල පිටපත් අමාත්‍යවරයා විසින්, ඒ වාර්තා හා ගිණුම් ප්‍රකාශ අදාළ වන්නා වූ වර්ෂයට පසුව එළඹෙන වර්ෂය අවසාන වීමට පෙර පාර්ලිමේන්තුවෙහි සභාගත කරනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තියේ සඳහන් කරන ලද වාර්තාවල සහ ප්‍රකාශවල පිටපත් දුම්රිය අධිකාරියේ වියදමින් මුද්‍රණය කිරීමට සහ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන යම් මිලකට ඒවා මහජනයා විසින් මිලට ගැනීමට හැකිමට මණ්ඩලය විසින් සැලැස්විය යුතු ය.

## V වන කොටස

## සාමාන්‍ය කරුණු

31. දුම්රිය අධිකාරිය වෙනුවෙන් වූ ගිවිසුම් පහත දැක්වෙන පරිදි ඇතිකර ගනු ලැබිය හැකි ය:— ගිවිසුම්.

(අ) පුද්ගලික තැනැත්තන් අතර ඇතිකර ගන්නා ලද්දේ නම් ලියවිල්ලක් විය යුතු යයි නීතියෙන් නියමිත ගිවිසුමක්, දුම්රිය අධිකාරිය වෙනුවෙන් දුම්රිය අධිකාරියේ මුද්‍රාව යටතේ ලියවිල්ලකින් ඇතිකර ගනු ලැබිය හැකි ය;

(ආ) පුද්ගලික තැනැත්තන් අතර ඇතිකර ගන්නා ලද්දේ නම් වගකීම භාර ගනු ලබන පාර්ශ්වකරුවන්ගේ අත්සන් සහිතව ලියවිල්ලකින් විය යුතු යයි නීතියෙන් නියමිත ගිවිසුමක්, මණ්ඩලය විසින් ඒ සඳහා යථා පරිදි බලය දී ඇති යම් තැනැත්තකු හෝ තැනැත්තන් විසින් අත්සන් කරනු ලැබ, අධිකාරිය වෙනුවෙන් ලියවිල්ලකින් ඇතිකර ගනු ලැබිය හැකි ය; තව ද,

(ඇ) පුද්ගලික තැනැත්තන් අතර ඇතිකර ගන්නා ලද්දේ නම් ලියවිල්ලකින් නොව වාචිකව ඇතිකර ගන්නා ලද්දේ වුව ද නීතියෙන් වලංගු වන්නා වූ යම් ගිවිසුමක්, මණ්ඩලය විසින් ඒ සඳහා යථා පරිදි බලය දී ඇති යම් තැනැත්තකු හෝ තැනැත්තන් විසින් අධිකාරිය වෙනුවෙන් ලියවිල්ලකින් ඇතිකර ගනු ලැබිය හැකි ය.

දුම්රිය අධිකාරියේ සාමාජිකයන්, නිලධරයන් හා සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ කාර්ය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු බව.

32. දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව හා එහි කාර්ය සඳහා දුම්රිය අධිකාරියේ සියලු ම සාමාජිකයන්, නිලධරයන් හා සේවකයන් රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

දුම්රිය අධිකාරිය, අල්ලස් පනතේ අර්ථානුකූලම උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු බව.

33. දුම්රිය අධිකාරිය අල්ලස් පනතේ අර්ථානුකූලම උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගනු ලැබිය යුතු ය.

දුම්රිය අධිකාරියේ මුද්‍රාව.

34. (1) දුම්රිය අධිකාරියේ මුද්‍රාව මණ්ඩලයේ හෝ මණ්ඩලය විසින් තත් කාර්ය සඳහා බලය දෙන ලද දුම්රිය අධිකාරියේ යම් නිලධරයකුගේ භාරයේ තිබිය යුතු ය.

(2) දුම්රිය අධිකාරියේ මුද්‍රාව මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන යම් ආකාරයකින් වෙනස් කරනු ලැබිය හැකි ය.

(3) මණ්ඩලයේ සභාපතිවරයා සහ මණ්ඩලය විසින් බලය දෙනු ලැබූ තවත් එක් සාමාජිකයකු ඉදිරිපිට දී හැර, දුම්රිය අධිකාරියේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට හෝ ලේඛනයකට තබනු නොලැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට සාක්ෂි වශයෙන් ඒ දෙදෙනා විසින් ඒ සාධන පත්‍රයට හෝ ලේඛනයට තම අත්සන් තබනු ලැබිය යුතු ය.

තඩු පැවරීමෙන් ආරක්ෂා භාව.

35. (1) (අ) මේ පනත යටතේ හෝ දුම්රිය ආඥාපනත යටතේ දුම්රිය අධිකාරිය විසින් සද්භාවයෙන් කරන ලද නැතහොත් කරන ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් දුම්රිය අධිකාරියට විරුද්ධව ; හෝ

(ආ) මේ පනත යටතේ හෝ දුම්රිය ආඥාපනත යටතේ හෝ දුම්රිය අධිකාරියේ විධානය පරිදි මණ්ඩලයේ යම් සාමාජිකයකු හෝ දුම්රිය අධිකාරියේ යම් නිලධරයකු හෝ සේවකයකු විසින් සද්භාවයෙන්

කරන ලද නැතහොත් කරන ලැදැයි කියනු ලබන යම් යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ සාමාජිකයාට, නිලධරයාට හෝ සේවකයාට විරුද්ධව

කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

(2) දුම්රිය අධිකාරිය විසින් හෝ දුම්රිය අධිකාරියට විරුද්ධව යම් අධිකරණයක් ඉදිරියේ දී පවරනු ලැබූ යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී දුම්රිය අධිකාරිය විසින් දරනු ලැබූ යම් වියදමක්, දුම්රිය අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර, එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී දුම්රිය අධිකාරියට ගෙවන ලද හෝ දුම්රිය අධිකාරිය විසින් අයකර ගන්නා ලද ගාස්තු කිසිවක් දුම්රිය අධිකාරියේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ හෝ දුම්රිය ආඥාපනත යටතේ හෝ දුම්රිය අධිකාරියේ විධානය පරිදි හෝ කරන ලද නැතහොත් කරන ලැදැයි කියනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව යම් අධිකරණයක් ඉදිරියේ පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී, එකී ක්‍රියාව කරන ලද්දේ සද්භාවයෙන් යයි අධිකරණය තීරණය කරන්නේ නම්, ඔහු විසින් දරන ලද යම් වියදම්, ඒවා ඒ සිවිල් හෝ අපරාධ නඩුවේ දී ඔහු විසින් අයකර ගන්නා ලද්දේ නම් මිස, දුම්රිය අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

36. 1979 අංක 7 දරන රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබා ගැනීමේ) පනත, මෙහි දෙවන උපලේඛනයෙහි දක්වා ඇති පරිදි සංශෝධනය කරනු ලැබේ. 1979 අංක 7 දරන රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබාගැනීමේ) පනත සංශෝධනය කිරීම.

37. දුම්රිය ආඥාපනත මේ පනතේ තුන්වන උපලේඛනයෙහි දක්වා ඇති පරිදි සංශෝධනය කරනු ලැබේ. (200 වන අධිකාරය වූ) දුම්රිය ආඥාපනත සංශෝධනය කිරීම.

38. (1) නියම කළ යුතු යයි මේ පනතින් නියමිත හෝ නියෝග සෑදීමට මේ පනතින් බලය දී ඇති යම් කාරණයක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය. නියෝග.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලැබූ දිනයේ දී හෝ නියෝගයේ සඳහන් යම් පසු දිනයක හෝ එය ක්‍රියාත්මක විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එසේ අනුමත කරනු නොලැබූ සෑම නියෝගයක්ම, එය යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොමැතිව, එහි අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබුවේ යයි සල කනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

අර්ථ නිරූපණය.

39. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි—

"ප්‍රාග්ධන ආයෝජන" යන්නෙන්, එහි ව්‍යාකරණමය ප්‍රභේද හා සජාතීය යෙදුම් ද සහිතව, දුම්රිය අධිකාරියේ දුම්රිය මාර්ග පද්ධතිය හෝ එහි ධාවන ශක්‍යතාව වර්ධනය කිරීමෙහි හෝ යම් ප්‍රාග්ධන වත්කමක් මිල දී ගැනීමේ හෝ අළුත්වැඩියා කිරීමේ නැතහොත් නැවත සකස් කිරීමේ ලා දුම්රිය අධිකාරිය විසින් වියදම් කරන ලද යම් මුදලක් අදහස් වේ;

"සභාපතිවරයා" යන්නෙන් 3 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (අ) ඡේදය යටතේ පත් කරන ලද දුම්රිය අධිකාරියේ සභාපතිවරයා අදහස් වේ;

"පළාත් පාලන ආයතනය" යන්නෙන්, යම් මහ නගර සභාවක්, නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර, එවැනි යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරනු ලබන හා ඉටු කරනු ලබන බලතලවලට, කාර්යවලට හා කර්තව්‍යවලට අනුරූප වන්නා වූ හෝ සමාන වන්නා වූ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම හා ඉටු කිරීම සඳහා යම් නීතියක් මගින් හෝ නීතියක් යටතේ හෝ ඇති කොට පිහිටුවන ලද යම් අධිකාරියක් ද ඊට ඇතුලත් වේ;

"කළමනාකාර අධ්‍යක්ෂවරයා" යන්නෙන්, 9 වන වගන්තිය යටතේ පත් කරන ලද දුම්රිය අධිකාරියේ කළමනාකාර අධ්‍යක්ෂවරයා අදහස් වේ;

"පළාත් සභාව" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVIIඅ පරිච්ඡේදය යටතේ පිහිටුවන ලද පළාත් සභාවක් අදහස් වේ,

"රාජ්‍ය සේවා බන්ධන ගිවිසුම" යන්නෙන්, යම් රජයේ දෙපාර්තමේන්තුවක්, රාජ්‍ය සංස්ථාවක්, පළාත් සභාවක් හෝ පළාත් පාලන ආයතනයක් සඳහා, 6 වන වගන්තියේ (අ) ඡේදය යටතේ නියම කර ඇති අනුප්‍රමාණවලට සහ ගාස්තු ක්‍රමවලට වඩා අඩු අනුප්‍රමාණ සහ ගාස්තු ක්‍රම අනුව සලස්වනු ලබන, යම් සේවා සඳහා සහ එවැනි සේවා සැපයීමේ දී දුම්රිය අධිකාරිය විසින් දරන ලද යම් ප්‍රාග්ධන වියදම් සඳහා දරන ලද යම් පාඩුවක් ප්‍රතිපූරණය කිරීම පිණිස ආණ්ඩුව එකඟ වී ඇත්තේ ආණ්ඩුව සහ දුම්රිය අධිකාරිය අතර ඇතුළත් වී ඇති යම් ගිවිසුමක් යටතේ ද ඒ ගිවිසුම ඉන් අදහස් වේ.

40. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

### පළමුවන උපලේඛනය

#### මණ්ඩලයේ සාමාජිකයන්ට අදාළ විධිවිධාන

1. යම් තැනැත්තකු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හෝ පළාත් සභාවක මන්ත්‍රීවරයකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු වේ නම් හෝ එලෙස පත් වේ නම්, ඔහු මණ්ඩලයේ සභාපතිවරයා වශයෙන් හෝ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ එසේ කටයුතු කරගෙන යාමට හෝ නුසුදුස්සකු විය යුතු ය.

2. යම් තැනැත්තකු මණ්ඩලයේ සභාපතිවරයා ලෙස හෝ සාමාජිකයකු ලෙස පත් කරනු ලැබීමට පෙර මණ්ඩලයේ සභාපතිවරයා හෝ සාමාජිකයකු වශයෙන් ඔහුගේ කර්තව්‍ය ඉටු කිරීම අකරෙගි හානිකර ලෙස බලපෑ හැකි මුදල් පිළිබඳ යම් සම්බන්ධතාවක් හෝ වෙනත් සම්බන්ධතාවක් ඒ තැනැත්තාට නොමැති බවට අමාත්‍යවරයා සෑහීමට පත් විය යුතු ය; තව ද තමා විසින් පත් කරන ලද මණ්ඩලයේ සභාපතිවරයාට හෝ සෑම සාමාජිකයකුට ම එවැනි සම්බන්ධතාවක් නොමැති බවට ද අමාත්‍යවරයා එවැනි සෑම තැනැත්තකු සම්බන්ධයෙන් කලින් කල සෑහීමට පත් විය යුතු ය. මණ්ඩලයේ සභාපතිවරයා හෝ සාමාජිකයකු වශයෙන් අමාත්‍යවරයා විසින් පත් කරන ලද, නැතහොත් පත් කිරීමට අදහස් කරන යම් තැනැත්තකු විසින්, මේ ඡේදය යටතේ වූ තම කාර්ය කිරීම සඳහා තමාට අවශ්‍ය යයි අමාත්‍යවරයා සලකන තොරතුරු කිසිවක් අමාත්‍යවරයා විසින් ඉල්ලා සිටිනු ලැබූවිට ඒ තොරතුරු අමාත්‍යවරයා වෙත සපයනු ලැබිය යුතු ය.

3. මණ්ඩලය විසින් ඇති කර ගන්නා ලද හෝ ඇති කර ගැනීමට අදහස් කරන යම් ගිවිසුමක් පිළිබඳව කවර හෝ ආකාරයකින් වූ සම්බන්ධතාවක් කෙළින් ම හෝ අන්‍යාකාරයකින් ඇති මණ්ඩලයේ සභාපතිවරයා හෝ සාමාජිකයකු තමාගේ ඒ සම්බන්ධතාවේ ස්වභාවය මණ්ඩලයේ රැස්වීමක දී හෙළිදරව් කළ යුතු ය. ඒ හෙළිදරව් කිරීම මණ්ඩලයේ වාර්තාවල වාර්තාගත කරනු ලැබිය යුතු අතර, ඒ ගිවිසුම සම්බන්ධයෙන් මණ්ඩලය විසින් කරනු ලබන යම් සාකච්ඡාවකට හෝ තීරණයකට ඒ සභාපතිවරයා හෝ සාමාජිකයා සහභාගී නොවිය යුතු ය.

4. අමාත්‍යවරයා විසින් පත් කරන ලද මණ්ඩලයේ සභාපතිවරයා සහ සෑම සාමාජිකයකු ම මේ උපලේඛනයෙහි 5 වන හා 6 වන ඡේදවල විධිවිධානවලට යටත්ව, ඔහු පත් කරනු ලැබූ දිනයෙහි සිට අවුරුදු තුනක කාලයක් සඳහා ස්වකීය ධුරය දැරිය යුතු අතර, මේ උපලේඛනයේ 5 වන ඡේදය යටතේ ඔහු ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, ඔහු නැවත පත් කරනු ලැබීමට සුදුස්සකු විය යුතු ය:

එසේ වුව ද ධුරය හිස් කරන සභාපතිවරයා හෝ සාමාජිකයකු වෙනුවට අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සභාපතිවරයා හෝ සාමාජිකයකු, ඔහු කලින් ධුරය හිස් කරතහොත් මිස, ඔහු අනුප්‍රාප්ත වන්නේ යම් සභාපතිවරයකු හෝ සාමාජිකයකු වෙනුවට ද, ඒ සභාපතිවරයාගේ හෝ සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කොටස සඳහා ධුරය දැරිය යුතු ය.

5. අමාත්‍යවරයා විසින් පත් කරන ලද මණ්ඩලයේ සභාපතිවරයා හෝ යම් සාමාජිකයකු අමාත්‍යවරයා විසින් ඒ සඳහා කිසිදු හේතුවක් නොදක්වා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි අතර, ඒ ඉවත් කිරීම කිසිම අධිකරණයක දී හෝ විනිශ්චයාධිකාරයකදී ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

6. අමාත්‍යවරයා විසින් පත් කරන ලද මණ්ඩලයේ සභාපතිවරයාට හෝ සාමාජිකයකුට අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් කවර හෝ විටක සභාපතිවරයා වශයෙන් හෝ සාමාජිකයා වශයෙන් වූ ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

7. මණ්ඩලයේ සභාපතිවරයාට හෝ යම් සාමාජිකයකුට රෝගාතුරවීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා ස්වකීය ධුරයේ කාර්ය ඉටු කිරීමට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක—

(අ) ඔහු අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබූ සභාපතිවරයා හෝ සාමාජිකයෙක් නම්, අවස්ථාවෝචිත පරිදි, සභාපතිවරයා හෝ ඒ සාමාජිකයා වෙනුවෙන් ක්‍රියා කිරීම පිණිස අමාත්‍යවරයා විසින් වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය; නැතහොත්

(ආ) ඔහු මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලැබූ සාමාජිකයා නම්, ඒ සාමාජිකයා වෙනුවෙන් ක්‍රියා කිරීමට ඒ අමාත්‍යවරයා විසින් මහා භාණ්ඩාගාරයේ වෙනත් නියෝජිතයකු නම් කරනු ලැබිය හැකි ය.

8. මණ්ඩලයේ සියලුම සාමාජිකයන්ට හෝ යම් සාමාජිකයකුට මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන යම් පාරිශ්‍රමිකයක්, දීමනා හා වෙනත් වියදම් දුම්රිය අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය හැකි ය.

9. මණ්ඩලයේ යම් රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් තුන් දෙනකු විය යුතු ය. මණ්ඩලයේ සභාපතිවරයා මණ්ඩලයේ සියලු රැස්වීම්වල මූලාසනය දැරිය යුතු ය. මණ්ඩලයේ යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොසිටි විට, පැමිණ සිටින සාමාජිකයන් විසින් ඔවුන් අතුරින් සාමාජිකයකු ඒ රැස්වීමේ මූලාසනය දැරීම පිණිස තෝරා පත් කර ගනු ලැබිය යුතු ය.

10. මේ උපලේඛනයේ වෙනත් විධිවිධානවලට යටත්ව, මණ්ඩලය විසින් එහි රැස්වීම්වල හා ඒ රැස්වීම්වල කටයුතු කිරීම පිළිබඳ කාර්ය පටිපාටිය විධිමත් කර ගනු ලැබිය හැකි ය.

11. මණ්ඩලයේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් ඇතද මණ්ඩලයට ක්‍රියා කළ හැකි ය. මණ්ඩලයේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් තිබීම නම් හෝ එහි යම් සාමාජිකයකු පත් කිරීමෙහි හෝ නම් කිරීමෙහි ලා යම් දෝෂයක් තිබීමේ හේතුව නිසාම පමණක්, මණ්ඩලයේ යම් ක්‍රියාවක් හෝ කටයුත්තක් අවලංගු නොවිය යුතු ය; නැතහොත් අවලංගු වන්නේ යයි සලකනු නොලැබිය යුතු ය.

දෙවන උපලේඛනය (36 වන වගන්තිය)

1979 අංක 7 දරන රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබාගැනීමේ) පනතට කරනු ලබන සංශෝධන :

ඒ පනතේ 18 වන වගන්තියේ—

(අ) ඒ වගන්තියේ යෙදෙන "නිසි බලධරයා" යන්නෙහි අර්ථකථනයෙහි (අ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(අ) 1993 අංක 60 දරන දුම්රිය අධිකාරිය පනතින් පිහිටුවන ලද දුම්රිය අධිකාරියේ පාලනය යටතේ ඒ ඉඩම පවත්නා අවස්ථාවක, දුම්රිය අධිකාරියේ කළමනාකරණ අධ්‍යක්ෂවරයා ;".

(ආ) ඒ වගන්තියේ යෙදෙන "රජයේ ඉඩම" යන්නෙහි අර්ථකථනයෙහි "හෝ 1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් සංස්ථා පනත" යන වචන හා ඉලක්කම් වෙනුවට "1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් සංස්ථා පනත හෝ 1993 අංක 60 දරන දුම්රිය අධිකාරිය පනත" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්.

තුන්වන උපලේඛනය (37 වන වගන්තිය)

දුම්රිය ආඥාපනතට කරනු ලබන සංශෝධන

1. මෙහි පහත I වන තීරයේ සඳහන් යම් යෙදුමක් හෝ වචනයක් ඒ ආඥාපනතේ යම් වගන්තියක යෙදෙන කවර හෝ අවස්ථාවක ඒ යෙදුම හෝ වචනය වෙනුවට මෙහි පහත II වන තීරයේ අනුරූප සටහනේ සඳහන් යෙදුම හෝ වචනය ආදේශ කිරීමෙන්—

| I වන තීරය (යෙදුම හෝ වචනය) | II වන තීරය (යෙදුම හෝ වචනය) |
|---|---|
| ආණ්ඩුව | ශ්‍රී ලංකා දුම්රිය අධිකාරිය |
| සාමාන්‍යාධිකාරිවරයා | ශ්‍රී ලංකා දුම්රිය අධිකාරිය |
| දුම්රිය සාමාන්‍යාධිකාරිවරයා | ශ්‍රී ලංකා දුම්රිය අධිකාරිය |
| දුම්රිය බලධාරීන් | ශ්‍රී ලංකා දුම්රිය අධිකාරිය |

2. ඒ ආඥාපනතේ 2, 3, 4 සහ 4අ වගන්ති සහ ඒ ආඥාපනතේ උපලේඛනය ඉවත් කිරීමෙන්.

3. ඒ ආඥාපනතේ 7 වන වගන්තියේ අතුරු වගන්තියේ "නියමිත ප්‍රමාණයක්" යන වචන වෙනුවට "ශ්‍රී ලංකා දුම්රිය අධිකාරිය විසින් සඳහන් කරනු ලබන ප්‍රමාණයක" යන වචන ආදේශ කිරීමෙන්.

4. ඒ ආඥාපනතේ 22 වන වගන්තියේ (2) වන උපවගන්තියේ යෙදෙන "දුම්රිය දෙපාර්තමේන්තුවේ නිලධරයකු" යන වචන වෙනුවට "දුම්රිය නිලධරයකු" යන වචන ආදේශ කිරීමෙන්.

5. ඒ ආඥාපනතේ 22 වන වගන්තියේ (3) වන උපවගන්තියේ "දුම්රිය දෙපාර්තමේන්තුවේ නිලධරයකු" යන වචන වෙනුවට "දුම්රිය නිලධරයකු" යන වචන ආදේශ කිරීමෙන්.

6. ඒ ආඥාපනතේ 44 වන වගන්තියේ—

(අ) "දුම්රිය මාර්ගය" යන්නෙහි අර්ථකථනය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථ කථනය ආදේශ කිරීමෙන්—

"දුම්රිය මාර්ගය" යන්නට ශ්‍රී ලංකා දුම්රිය අධිකාරිය සතු කරන ලද, සාදන ලද හෝ එය විසින් හෝ ඒ වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන යම් දුම්රිය මාර්ගයක් ඇතුළත් වේ;

(ආ) "දුම්රිය නිලධරයා" යන්නෙහි අර්ථ කථනය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථ කථනය ආදේශ කිරීමෙන්—

"දුම්රිය නිලධරයා" යන්නෙන් ශ්‍රී ලංකා දුම්රිය අධිකාරිය විසින් පත් කරන ලද යම් නිලධරයකු හෝ සේවකයකු අදහස් වන අතර, යම් දුම්රිය මාර්ගයක යම් ක්‍රියාවක් කිරීම පිණිස ශ්‍රී ලංකා දුම්රිය අධිකාරිය විසින් තත් කාලයෙහි සේවයෙහි නියුක්ත කරනු ලැබ සිටින යම් තැනැත්තෙක් ද එයට ඇතුළත් වේ; තවද

(ඇ) "දුම්රිය නිලධරයා" යන අර්ථ කථනයට ඉක්බිතිවම පහත දැක්වෙන අර්ථ කථනය ඇතුළත් කිරීමෙන් :—

"ශ්‍රී ලංකා දුම්රිය අධිකාරිය" යන්නෙන් 1993 අංක 60 දරන ශ්‍රී ලංකා දුම්රිය අධිකාරිය පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා දුම්රිය අධිකාරිය අදහස් වේ.